# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011

2013 දෙසැම්බර්

## BMGT E 1045 – ව්‍යාපාර නීතිය

ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (අ) "අර්පනයක් ඉදිරිපත් කිරීමට කරන ආරාධනාවක් අර්පනයක් නොවේ." මෙම ප්‍රකාශයෙහි අදහස විනිශ්චිත නඩු තීන්දු යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) අසංක සිය මෝටර් රථය රුපියල් මිලියනයකට හේමන්තට විකිණීම සඳහා අර්පනයක් ඉදිරිපත් කරයි. නමුත් හේමන්ත එම මෝටර් රථය රු. 950,000/= කට මිලදී ගැනීමට එකඟ වෙයි. නමුත් අසංක එම මිලට එය හේමන්ත වෙත ලබාදීම ප්‍රතික්ෂේප කරයි. එවිට හේමන්ත නැවතත් එම මෝටර් රථය රුපියල් මිලියනයකට මිලදී ගැනීමට කැමැත්ත පලකලද අසංක මෝටර් රථය හේමන්ත වෙත විකිණීම ප්‍රතික්ෂේප කරයි. ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් හේමන්ත, අසංකට එරෙහිව නඩු පැවරීමට අදහස් කරයි. විනිශ්චිත නඩු තීන්දුද අදාල කර ගනිමින් හේමන්ත වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 10)

(02) (අ) "අවනිදේශනය" ඔප්පු කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ කොන්දේසි මොනවාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) සහන් සහ අරවින්ද කුඩා ගංගාවක එකිනෙකට ප්‍රතිවිරුද්ධ ගං ඉවුරු වල රැඳී සිටින ලද අතර සහන් සිය බයිසිකලය අරවින්දට රු. 10000/= කට විකිණීම සඳහා වාචිකව උස් හඬින් අර්පනයක් ඉදිරිපත් කරයි. අරවින්ද විසින් වාචිකව උස් හඬින් එම අර්පනය ප්‍රතිග්‍රහනය කරන ලදී. නමුත් අවාසනාවකට එම අවස්ථාවේදී පහතින් පියාසර කළ ගුවන්යානයක හඬ හේතුකොටගෙන අරවින්දගේ ප්‍රතිග්‍රහනය, සහන් වෙත සන්නිවේදනය වූයේ නැත. සහන් සහ අරවින්ද අතර වලංගු ගිවිසුමක් තිබේදැයි විනිශ්චිත නඩු තීන්දු යොදා ගනිමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(03) (අ) ජෝන් එක්තරා පිංතූරයක් රු. 20,000/= මුදලකට රිචඩ් වෙත විකිණීම සඳහා ගිවිසුමකට එළඹෙයි. පිංතූරය සඳහා අළුත් රාමුවක් අවශ්‍ය වූ අතර ඒ සඳහා සති දෙකක කාලයක් තමාට අවශ්‍ය බවත්, එම කාලය අවසානයේ පිංතූරය රැගෙන යා හැකි බවත්, ජෝන්, රිචඩ් වෙත දන්වා සිටියි. රිචඩ් සති දෙක අවසානයේ මුදල් ගෙවා පිංතූරය රැගෙන

යාමට පැමිණියත්, ජෝන් එය රිචඩ් වෙත ලබාදීම ප්‍රතික්ෂේප කරයි. රිචඩ් වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 08)

(ආ) "විකුණුම්කරුවෙකුට තමාට ඇති අයිතියට වඩා හොඳ අයිතියක් ගැනුම්කරුවෙකුට ලබා දිය නොහැක." (Nemo dat quod non habet) මෙයින් අදහස් කෙරෙන නෛතිකමය සිද්ධාන්තය කුමක්දැයි දක්වා ඊට අදාල ව්‍යාතිරේඛයන් මොනවාදැයි පෙන්වා දෙන්න.

(ලකුණු 12)

(04) (අ) හවුල්කරුවෙකු සතු "ව්‍යාංග බලය" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? හවුල්කරුවෙකුගේ ව්‍යාංග බලය සම්බන්ධයෙන් ඇති නෛතිකමය සීමා කිරීම් මොනවාද?

(ලකුණු 10)

(ආ) අනුෂා සහ බිමල්කා නිමි ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක හවුල්කරුවෝ වෙති. අනුෂා, බිමල්කාගේ අනුදැනුමකින් තොරව සිය ප්‍රධාන කරඟකරුවෙකු වන ස්ටාර් ගාමන්ට් සමාගමේ මෝස්තර නිර්මාණ ශිල්පිනිය වන අරුණිට අල්ලස් දී ඔවුන් සතු නවීන ඇඳුම් මෝස්තර කිහිපයක් පිළිබඳව හෙළිදරව් කර ගනියි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ස්ටාර් ගාමන්ට් සමාගමට පාඩු සිදු විය. මේ සම්බන්ධයෙන් අනුෂා සහ බිමල්කාගේ වගකීමෙහි ස්වභාවය කුමක්දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(05) (අ) 'අපරානුමැතිය මත ඇති වන නියෝජ්‍යත්වය' යනු කුමක්ද? වලංගු අපරානුමැතියක් උදෙසා සපුරාලිය යුතු පූර්ව කොන්දේසි මොනවාදැයි සඳහන් කරන්න.

(ලකුණු 12)

(ආ) බන්දු භාණ්ඩ තොගයක් විකිණීම සඳහා නියෝජිතයෙකු ලෙස අමරව පත් කරයි. භාණ්ඩ විකිණීමේදී සෑම එක් ගණුදෙනුවකම වටිනාකම රු. 50,000/= වඩා අඩු නොවිය යුතු බවට ඔහු තවදුරටත් අමරට උපදෙස් දුනි. පහත සඳහන් සිද්ධීන් සම්බන්ධයෙන් අදාල පාර්ශවයන්ගේ නෛතිකමය තත්ත්වය කුමක්දැයි දක්වන්න.

(i) අමර භාණ්ඩ තොගයක් රු. 40,000/= කට පියල්ට විකුණන අතර, ගිවිසුම සඳහා අමර එළඹෙන්නේ ඔහුගේ නමින්ය.

(ලකුණු 04)

(ii) අමර භාණ්ඩ තොගයක් රු. 55,000/= කට ප්‍රදීප්ට විකුණයි. භාණ්ඩ තොගය එම මුදලට ලැබීමෙන් තමාට ලාභයක් අත්වූයේ යැයි සිතූ ප්‍රදීප් ඒ සඳහා ත්‍යාගයක් වශයෙන් රු. 2500/= ක මුදලක් අමර වෙත ලබා දෙයි.

(ලකුණු 04)

(06) (අ) ගනුදෙනු කළ හැකි ලියවිල්ලක තිබිය යුතු මූලික ලක්ෂණ මොනවාද?

(ලකුණු 06)

(ආ) පහත සඳහන් පිටසන් කිරීම් විස්තර කරන්න.

(i) හිස් පිටසන

(ii) විශේෂ පිටසන

(ලකුණු 04)

(ඇ) සිය ඥාති පුත්‍රයා වන අමිල උපාධිය පංති සාමාර්ථයක් සහිතව සමත් වුවහොත් ඔහුට රු. 25,000/= ක් ත්‍යාගයක් වශයෙන් දෙන බවට ගාමිණී පොරොන්දු වේ. අමිල, විභාගය සමත්වූ අතර ගාමිණී රු. 25,000/= චෙක්පතක් අමිල වෙත නිකුත් කරන ලදී. අමිල, ජනනි සමඟ විවාහ ගිවිසගෙන සිටි අතර, ඔහු අදාල චෙක්පත පිටසත් කොට ඇයට ත්‍යාගයක් වශයෙන් පිරිනමන ලදී. එවිට ජනනි, තමා රන්ලිය ගාමන්ට් ආයතනයෙන් මිලදී ගත් ඇඳුම් තොගයක් උදෙසා එම චෙක්පත මඟින් ගෙවීම් කරන ලදී. අදාල චෙක්පත තමා ප්‍රිය නොකරන ජනනි වෙත අමිල විසින් දුන් බැව් ගාමිණී දැනගත් විට, ඔහු එම චෙක්පත සඳහා ගෙවීම් නොකරන ලෙස බැංකුවට උපදෙස් දුනි. අදාල පාර්ශවයන්ගේ වගකීම පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(07) (අ) 1935 වෘත්තීය සමිති ආඥා පනතට අනුව වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීමේ අරමුණු මොනවාද?

(ලකුණු 04)

(ආ) රාජ්‍ය සේවකයන්ගේ වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් බලපාන විශේෂ සීමා කිරීම් මොනවාද?

(ලකුණු 06)

(ඇ) ලියාපදිංචි කරන ලද වෘත්තීය සිමිති වලට හිමි අයිතිවාසිකම්, මුක්තීන් හා වරප්‍රසාද පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(08) පහත සඳහන් කරුණු වලට අවධානය යොමු කරමින් සාප්පු හා කාර්යාල සේවක පනත පිළිබඳ සටහනක් ලියන්න.

(අ) වැඩ කරන වේලාවන්

(ආ) අතිකාල ගෙවීම

(ඇ) රජයේ නිවාඩු

(ඈ) වාර්ෂික නිවාඩු

(ඉ) පත්වීමේ ලිපිය

(ඊ) මාතෘ ප්‍රතිලාභ

(ලකුණු 20)